# 07

# සීලය හා භෞතික සංවර්ධනය

සසර දුක් සහිත ය. නැවැත නැවැතත් කර්මානුරූප ව ඉපදීම, ලෙඩවීම, මහලුවීම, මරණය, කැමැති දේ නොලැබීම, ප්‍රියයන්ගෙන් වෙන්වීම, අප්‍රියයන් හා එක්වීම ආදී දුක් දොම්නස්වලට ගොදුරු වීමට සසර වසන අපට සිදු වී තිබේ. අසාර වූ අතෘප්තිකර වූ මේ දුක් සහිත සසර පිළිබඳ ව අප තුළ අවබෝධයක් ඇති කිරීමත්, සසරින් එතෙර ව නිවන් පසක් කර ගැනීම පිණිස මග පෙන්වීමත් බුදු දහමෙහි මූලික අරමුණ ය. බුදුරජාණන් වහන්සේ විසින් පෙන්වා වදාළ ත්‍රිවිධ ශික්ෂාවෙකින් යුක්ත වූ ඒ නිවන් මගෙහි පළමු ශික්ෂාව සීලයයි; යහපත් චරිත සංවර්ධනයයි; පුද්ගලයාගේ කායික වාචසික සංවරයයි. බාහිර හැදියාවයි; ආර්ය අෂ්ටාංගික මාර්ගයෙහි එන සම්මා වාචා නම් වූ වාචසික සංවරය ද සම්මා කම්මන්ත නම් වූ කායික සංවරය ද සම්මා ආජීව නම් වූ යහපත් දිවි පැවැත්ම ද සීල ශික්ෂාවට අයත් ය.

වචනයෙන් සිදුවන මුසාවාදා, පිසුනාවාචා, ඵරුසාවාචා, සම්පප්ඵලාපා යන සාවද්‍ය හැසිරීම් හැරදමා සත්‍යවාදී වීම, මිනිසුන්ගේ සමගියට තුඩු දෙන පරිදි කතා කිරීම, මටසිළුටු මිහිරි බස් කීම හා අර්ථවත් වූ දැහැමි වචනයෙන් යුක්ත වීම ද වාචසික සීලයයි. වාචසික වශයෙන් නොකළයුත්ත හෙවත් විරිත හැරපියා කළයුත්ත හෙවත් සිරිත අනුගමනය කිරීමයි. එසේම කයින් සිදුවන ප්‍රාණඝාත, අදත්තාදාන, කාමමිථ්‍යාචාර යන සාවද්‍ය ක්‍රියාවන්ගෙන් වැළකී සියලු සතුන්ට කරුණාව මෛත්‍රිය දැක්වීම, දුන් දේ ගැනීම හා විරුද්ධ ලිංගිකයන් ශිෂ්ඨසම්මත පරිදි ඇසුරු කිරීම ද කායික සීලය වේ. කායික වශයෙන් නොකළයුත්ත හෙවත් විරිත හැරපියා කළයුත්ත හෙවත් සිරිත අනුගමනය කිරීමයි. තවද අනේකාකාර වූ අකුසල සහගත හානිකර දිවි පැවතුම් හැරපියා දැහැමි සාධාරණ දිවි පැවතුම්හි යෙදීම ආජීව සීලයයි. එහිදී ද නොකළයුත්ත හෙවත් විරිත හැරපියා කළයුත්ත හෙවත් සිරිත අනුගමනය කරනු ලැබේ. මෙසේ කය ද වචනය ද සංවර කරන, හික්මවාලන සීලය නිවන් මගෙහි ප්‍රතිෂ්ඨාව ය; පිහිට ය. එය ආදී චරණයයි. සීලයෙහි පිහිටා සමාධිය ද සමාධියෙහි පිහිටා ප්‍රඥාව ද උපදවා ගත යුතු ය. සීලයෙන් තොර සමාධියක් නැත. සමාධියෙන් තොර ප්‍රඥාවක් නැත. ප්‍රඥාවෙන් තොර විමුක්තියක් ද නැත.

බුදු දහම අනුව ඉහත දැක්වූ පරිදි සීලය ශික්ෂාවකි. එය ත්‍රිවිධ ශික්ෂාවෙහි පළමුවැන්නයි. සදාචාරාත්මක දිළිඳු බව දුරු කරන, සාරවත් බව ඇති කරන, ආර්ය ධන සතක් ඇතැයි වදාළ බුදුරජාණන් වහන්සේ සීලය ද ඉන් එකකැයි වදාළහ. සසර

සැප ගෙන එන පින්කම් දහයක් ඇතැයි වදාළ උන්වහන්සේ සීලය ද එයට ඇතුළත් කළහ. රජුන් විසින් යහපත් පාලනයක් උදෙසා අනුගමනය කළ යුතු රාජ ධර්ම අතරද සීලය ඇතුළත් වේ. එනම් රජු ප්‍රතිපත්තිගරුක සදාචාරවත් අයකු වීමයි. එසේම සීලය බෝසත්වරුන් විසින් බුදුබව ලබා ගැන්ම පිණිස පුරනු ලබන පාරමිතාවක් ද වේ. එය දස පාරමිතාවෙහි දෙවැන්න ය. මෙසේ සීලය පින්කිරිය වතකි; ධනයකි; රාජ ධර්මයකි; පාරමිතාවකි; ගිහි පැවිදි සැමට සැපයකි. සියලු සුවඳ ඉක්මවා යන සුවඳකි.

සීලයෙහි විවිධ ප්‍රභේද වඩාත් පැරණි සූත්‍ර දේශනාවල මෙන් ම පසුකාලීන ධර්ම ග්‍රන්ථවල ද දක්වා තිබේ. භාවිතාමය වශයෙන් ශික්ෂා පද සංඛ්‍යාව අනුව පංච සීලය, උපෝසථ අෂ්ටාංග සීලය, ආජීවක අෂ්ටමක සීලය, දස සීලය ආදී වශයෙන් ද අපට සීලය හඳුනාගත හැකි ය. බෞද්ධ සමාජය තුළ භාවිතයෙහි ඇති ආචාර ධර්මවල මූලිකත්වය ගන්නා පංච සීලය පුද්ගලයාගේ මෙන් ම සමාජයේ ද යහපැවැත්ම නොයෙක් පැතිවලින් උදාකරන්නේ ය. සමාජයක කවර පුද්ගලයකුට වුවද තම ජීවිතයේ යහපැවැත්ම පිණිස ජීවිතාරක්ෂාව පිළිබඳ සහතිකයක් තිබිය යුතු ය. අන් අය විසින් තමන් විනාශ කර දමනු ඇතැයි, තමන්ට හිංසා කරනු ඇතැයි යමෙකුට පෙනීයයි නම් එය ප්‍රසන්න ජීවිතයක් නොවේ. මිනිසාට නිදහසේ ජීවත් වීමේ අයිතිය තහවුරු කරන පරිසරයක් එහි නැත. පංච සීලයෙහි පළමු ශික්ෂා පදය එම අප්‍රසන්න සැකමුසු බව දුරලමින් ජීවිතාරක්ෂාව පිළිබඳ සහතිකයක් අපට ලබා දෙයි. පන්සිල් රකින්නා ද මිනිස් ජීවිතයට ගරු කරයි. හෙතෙම මෙත්, කරුණා ගුණ ඇත්තෙකි. තමාගේම යැයි සැලකිය හැකි, තම අවශ්‍යතා සඳහා යොදාගත හැකි, පෞද්ගලික සම්පතකට හිමිකම් කීමට ද සෑම පුද්ගලයකුට ම අයිතිය ඇත. සොරකම් කිරීම, මංකොල්ල කෑම යනු එම අයිතිය උදුරා ගැන්මකි. පුද්ගලයාගේ දේපළ අයිතියට අනවශ්‍ය හා අසාධාරණ බලපෑමක් කිරීමකි. සොරකමින් වළකින්නා එම අයිතියට ගරු කරයි. එය උදුරා නොගනී. ඒ නිසාම හෙතෙම නිරපරාධී වන්නේ ය. සමාජයට හානි නොකරන්නකු ද වේ. නුදුන් දේ නොගන්නා හා දුන්දේ පමණක් ගන්නා යුක්තිගරුක අයකු වේ. ගිහි සමාජය යනු සම්මත විවාහ ක්‍රම මගින් පවුල් වශයෙන් සංවිධානය වූවකි. අඹුසැමි සබඳතාව ඉන් ඉතා වැදගත් තැනක් ගනියි. ශිෂ්ඨ සම්මත වූ එබඳු සබඳතාවයනට හානි කිරීම වරදකි. පුද්ගල නිදහසට හා අයිතියට එරෙහි වීමකි. කාම මිථ්‍යාචාරය ලෙස බුදුදහම එය හඳුන්වයි. පංච සීලයෙහි තෙවැනි ශික්ෂා පදය රකින්නා එම තත්ත්වය මග හරවයි; ශිෂ්ටත්වය රකියි; පවුල් ජීවිතයේ නිදහස ගරු කරයි. සමාජයක පුද්ගලයන් අතර සබඳතා පවත්වන්නේ අදහස් හුවමාරුව මගින් කථාබස් කිරීම මාධ්‍යය කොටගෙන ය. සෑම පුද්ගලයකුට ම අනුන් විසින් තමන් රැවටීමෙන් තොරව අන්‍යොන්‍ය විශ්වාසයෙන් ජීවත් වීමේ අයිතිය ඇත. සිව්වන ශික්ෂාපදය එය ආරක්ෂා කරයි. මුසාවාදයෙන් වළකින පුද්ගලයා ද ඇදහිය හැකි වචන ඇති සත්‍යවාදියකු වේ. ඇත්තෙන් ඇත්ත ගළපා කියන, විශ්වාස කළ හැකි වචන ඇත්තෙකු වේ. සමාජයෙහි ජීවත්වන සියල්ලන්ට ම ඖෂධ හා උත්තේජක ද්‍රව්‍ය මෙන් ම ද්‍රාවණ ආදිය මගින් මනස විකෘති කරගන්නවුන්ගේ හිරිහැරවලින් මිදී ජීවත් වීමට අයිතිය තිබේ. මත් දියර, මත් ද්‍රව්‍ය භාවිත කරන්නෝ එම අයිතියට හානි කරති. ඔවුහු තමන් තමන් ව ම වනසා ගන්නෝ ය. පස්වැනි ශික්ෂාපදය සුරකින එබඳු භාවිතයන්ගෙන් තොර තැනැත්තා මනා සිහි නුවණ ඇත්තකු වේ. සිය ධනය ද රැකගනී. හෙතෙම සාමකාමී ය; නීරෝගී ය; ලජ්ජා බය ඇති තැනැත්තකු ද වේ.

ඉහත දක්වන ලද්දේ සීල ශික්ෂාවෙහි මූලික භාවිතය වන පංච සීලයෙහි පෞද්ගලික හා සමාජමය ඵලදායකත්වයයි. එබඳු සීල ප්‍රතිපදාවන් මගින් හැඩගසා ගත් දියුණු චරිත ඇති මිනිස්සු තමන් සතු භෞතික සම්පත් ආරක්ෂා කර ගනිමින් ඒවා නිසිලෙස පරිහරණය කිරීමට සමත් වන්නෝ ය. ඒ නිසාම ඔවුහු විවිධ පැතිකඩවලින් දියුණුවට පත්වෙති; සංවර්ධනය වෙති. භෞතික සංවර්ධනයට ද සීලය උපකාරී වේ. ආහාර, නිවාස, ඇඳුම්, බෙහෙත් ආදී මෙලොව සැපවත් ජීවිතයකට අවශ්‍ය සම්පත් ඇතිව තෘප්තිමත් ව තුටුපහටු ව හා සාමකාමී ව ජීවත් වීම භෞතික සංවර්ධනයේ ප්‍රතිඵලයයි. ගුණ දහමින් දියුණු වීම, නොකළයුත්ත නොකරන, කළයුත්ත කරන, සිතින් කයින් හා වදනින් ශිෂ්ටසම්මත හා දියුණු පෞරුෂ ඇත්තවුන් වීම සදාචාරාත්මක සංවර්ධනයයි. හුදෙක් බාහිර වශයෙන් ප්‍රකට වන අහස උසට නැගුණ මහා මන්දිර, නොයෙක් අතට විහිදුණු මංමාවත් ආදියෙන් හෝ ඉහත කී මූලික අවශ්‍යතා ආදියෙන් සංවර්ධනය වීම අංග සම්පූර්ණ සංවර්ධනයක් නොවේ. එසේ වීමට නම් සදාචාරාත්මක සංවර්ධනය ද ඊට සමගාමී ව පැවතිය යුතු ය. තිරසාර වූ පිරිපුන් සංවර්ධනය එයයි. පංච සීලය ඒ සඳහා මග පෙන්වන්නේ ය. එය ගේහසිත සීලය ලෙස ද නිත්‍ය සීලය ලෙස ද හැඳින්වෙයි.

උපෝසථ අෂ්ඨාංග සීලය නිති පන්සිල් රකින ගිහියාට පෙහොය අටසිල් රැකීමට මග පෙන්වන්නේ ය. එමගින් පංච සීලයෙහි ද දක්වන ලද ප්‍රාණඝාත, අදත්තාදාන, මුසාවාද, සුරාමේරය යනාදී නොකළයුත්ත නොකිරීම ඉගැන්වේ. ඒ සමග ම අබ්‍රහ්ම චරියාව හැරපියා බ්‍රහ්ම චරියාව රැක්මට ද, විකාල භෝජනයෙන් වැළකීමටත් නැටුම් ගැයුම් කිරීමෙන් හා මල් සුවඳ ආදිය දැරීමෙන් ද, විවිධ සැරසිල්ලෙන් ද වැළකීමටත්, උස් අසුන් මහ අසුන් නොදැරීමටත් ඉගැන්වේ. සමස්තයක් වශයෙන් දෙවනුව ද දක්වන ලද විරති ශික්ෂාවෝ අල්පේච්ඡ ජීවිතයකට ගිහියන් පොළඹවති. නිවනට යන ජවවේගය වැඩි දියුණු කරති.

ආජීව අෂ්ටමක සීලය ප්‍රාණඝාත, අදත්තාදාන, කාමමිත්‍යාචාර, මුසාවාදා, පිසුණාවාචා, ඵරුසාවාචා, සම්පප්ඵලාපා යන දස අකුසලයෙහි එන කය හා වචනය සංවර කරන පිළිවෙත් සතෙන් හා මිච්ඡා ආජීවය හැර සම්‍යක් ආජීවයෙන් ද යුක්ත වීමට උගන්වනු ලැබේ.

දස සීලය ඉහත කී උපෝසථ අෂ්ඨාංග සීලයෙහි ම ඉදිරි පියවරකි. එහිදී නච්ච ගීත වාදිතයෙන් වෙන්වීම හා මල් සුවඳ ආදියෙන් වෙන්වීම ද ශික්ෂාපද දෙකක් ලෙස ගැනේ. දස වැන්න ජාත රූප රජත පටිග්ගහණ නම් වූ රන්, රිදී, මසු, කහවණු ආදී මූල්‍ය සම්පත් භාවිතයෙන් වැළකීම ද එක්කොට ඇත. පංච සීලය ඉක්මවා මෙම සීල ශික්ෂාවෝ, වරදින් වැළකී සිටීම සමග ම වඩාත් අල්පේච්ඡ ජීවිතකට හුරුවීමෙන්, අත්හැරීම ප්‍රගුණ කොට නිවනට වඩ වඩාත් ළංවීමට මග පෙන්වති.

කය එනම් දෑත්, දෙපා, ඇස්, දෙකන් සහිත වූ මේ ශරීරය ද, වචනය එනම් අපගේ කතාබහ සමාජයේ සෙසු අය සමග අදහස් හුවමාරු කර ගන්නා මාධ්‍යය ද, සංවර වීම, හික්මවීම, විධිමත් වීම සීලයයි. එබඳු හැඩගැස්මකින් තොර වූ මිනිසුන්ට පෞද්ගලික ව තම සැපත, යහපත හා වැඩිදියුණුව ඇති කරගත නොහැකි ය. ඔවුහු අනේකාකාර වූ දුසිරිත් හේතුවෙන් පරාභවයට ම පත් වෙති. භෞතික වශයෙන් ආර්ථික දියුණුවක් හෝ

ආධ්‍යාත්මික වශයෙන් මානසික දියුණුවක් ළඟා කර ගැන්මට ද ළඟා කරගත් දියුණුව පවත්වාගෙන යාමට ද අසමත් වෙති. නුවණැත්තවුන්ගේ ගැරහුමට ලක්වෙති. ඔවුන්ගේ ගෘහ ජීවිත පිරිහෙයි. දුසිරිත් නිසා ධනය ද වැනසෙයි. ඔවුන් සමාජයට අප්‍රිය වේ. ප්‍රාණඝාත, පර හිංසා, අදත්තාදාන, කාම මිථ්‍යාචාර, මුසාවාද, සුරාමේරය ආදී දුසිරිත් හේතුවෙන් විනයෙන් පිරිහී ගිය එබඳු මිනිසුන් සමග කවර ආයතනයක් වුව ද ඵලදායිතාව වෙත ගෙනයා නොහැකි ය. මනා කළමනාකරණයකින් පවත්වාගෙන යාමට ද නොහැකි ය. අසංවර මිනිසුන් නිසා සාමය ද සුහදත්වය ද බිඳ වැටෙයි. සහජීවනය නැතිව යයි. දුසිල් බව ඇති කරන දුසිරිත් නිසා කායික මානසික සෞඛ්‍යයෙන් පිරිහෙන මිනිසුන්ට වෙහෙස මහන්සි වී උද්යෝගයෙන් වීර්යවන්තව වැඩපළ කළ නොහැකි වීමෙන් එබඳු මිනිසුන් ඇති ආයතනවල දියුණුව ඇණ හිටියි. පවුල් අවුල් වේ. පිරිහීම් ළඟා වේ. මේ අනුව සිල්වත් බව නොවේ නම් විනයවත් බව විවිධාකාරයෙන් පුද්ගලයාගේ මෙන් ම සමාජයේ ද, පවුල් සංස්ථාව ඇතුලු ආයතන හා සංවිධානවල ද පිරිහීම වළක්වා ගැනීමටත් දියුණුව ඇති කර ගැන්මටත් උපකාරී වන්නේ ය. සීලය හේතුවෙන් මහත් වූ භෝග සම්පත් ලැබෙන්නේ ය.

ජල පහසුව ද විදුලිය ද දියුණු මංමාවත් ද සුවිසල් නිවාස ආදිය ද ඇතිව හොඳින් කා බී ජීවත් වීම පමණක් මිනිසාගේ දියුණුව යැයි සිතන්නවුන් බුදුදහමෙහි සමකොට ඇත්තේ ගසාකෑමෙහි සමත් සාර ධර්ම මග හැර යන කිලිටි දිවි පැවතුම් ඇති සූර කපුටන්ට ය.

ලෝවැඩ සඟරාව ලියූ වීදාගම හිමිපාණෝ සීල ශික්ෂණය තුළින් උදාකර ගත් සාරධර්ම සංවර්ධනයකින් තොරව හුදෙක් භෞතික සම්පත් ම රැස් කොටගෙන කා බී ජීවත් වීම උතුම් යැයි සිතන මිනිසුන් ගැන මෙසේ පැවසූහ.

කාලා රසමුසු බොජන කර පෙම්
ගාලා සුවඳැති සඳුනුත් මනරම්
ලාලා අබරණ නිසිලෙස සැරහුම්
පාලා ගිය වැනි බහුරූ කෝළම්

දිව පිනවන රසමුසු දේම කමින් බොමින්, නැහැය පිනවන සුවඳ සඳුන් ආලේප කර ගෙන ආබරණ ආයිත්තම්වලින් සැරසී භෞතික සැපයෙහි පමණක් ගිජුව ජීවත්ව මිය ගිය විට ඒ තැනැත්තා බහුරූ කෝළමක් පෙන්වා ගියාක් වැනි ය. එබැවින් සීල ශික්ෂණය පෙරටු කොටගත් සාරධර්ම සංවර්ධනය ද අවශ්‍ය ය. එය මිනිසා තිරිසනාගෙන් වෙන් කොට උසස් කොට මැන ගත හැකි මූලික කරුණයි.

## සාරාංශය

සීලය බෞද්ධ ශික්ෂණයේ පදනමයි. නිවන් මගෙහි ආරම්භය ශික්ෂණයයි. එයින් කයත් වචනයත් සංවර කෙරේ. සීලයෙහි භාවිතාමය ප්‍රභේද රාශියක් සංඛ්‍යාත්මකව දක්විය හැකි ය. පුද්ගලයාගේ මෙන් ම සමාජයේ ද සැබෑ සංවර්ධනයේ අත්‍යවශ්‍ය පැතිකඩක් සීලයෙන් පෙන්වා දී තිබේ.

## ක්‍රියාකාරකම

1. භෞතික සංවර්ධනය හා සදාචාර සංවර්ධනය වෙන් වෙන්ව හඳුන්වන්න.
2. පන්සිල් මගින් තහවුරු වන මානව අයිතිවාසිකම් කවරේ දැයි පෙන්වා දෙන්න.

## පැවරුම

නූතන සමාජයේ සාරධර්ම පරිහානියට හේතු පිළිබඳ කණ්ඩායම් සාකච්ඡාවක් පවත්වා වාර්තාවක් සකස් කරන්න.

## පුහුණුවට

සුජීවං අහිරිකේන
කාක සූරේන ධංසිනා
පක්ඛන්දිනා පගබ්භේන
සංකිලිට්ඨේන ජීවිතං

(ධම්ම පදය - මල වග්ගය)

කවුඩෙකු මෙන් ගසා කෑමෙහි ශූර වූ, එබඳු හැකියාවන් ඇති (පවෙහි) ලජ්ජා නැති, අනුන්ගේ ගුණ මකන, ගෙන් ගෙට දුවන කිලිටි දිවි පැවතුම් ඇති තැනැත්තාට ජීවත් වීම ඉතා ලෙහෙසි ය.